“ වක්තෘවරුන් අතුරින් මිනිසුන් ඔහු විශ්වාස කිරීමට හේතු වූ, (ප්රාතිහාර්යක්) පිරිනමනු ලැබ, මිනිස් වර්ගයා එය විශ්වාස කළ කිසිම වක්තෘවරයෙක් නොවීය

නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ වක්තෘවරුන් අතුරින් මිනිසුන් ඔහු
විශ්වාස කිරීමට හේතු වූ, (ප්රාතිහාර්යක්) පිරිනමනු ලැබ, මිනිස් වර්ගයා එය විශ්වාස
කළ කිසිම වක්තෘවරයෙක් නොවීය. මට දෙනු ලැබ ඇත්තේ මා වෙත අල්ලාහ් දන්වා සිටි දිව්ය පණිවිඩයයි. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔවුන් අතුරින් බහුතරයක් දෙනා මා අනුගමනය කරන අය වීම ගැන මම අපේක්ෂා කරමි.” [صحيح] [متفق عليه]

සියලුම නබිවරුන් හට අල්ලාහ් සහාය දී ඇති බවත්, ඔවුන්ගේ වක්තෘභාවය සනාථ කරන අසාමාන්ය සංඥා සහ ප්රාතිහාර්යයන් ඔවුන්ට ලබා දුන් බවත්, ඒවා දකින අයට ඔවුන්ගේ සත්යවාදී බව විශ්වාස කිරීම අවශ්ය බවත්, ඔහු අභියෝගය ජය ගන්නා බවත්, ඔහුට ඉන් වැළකී සිටිය නොහැකි බවත්, නමුත් ඔහු එය ප්රතික්ෂේප කර මුරණ්ඩු විය හැකි බවත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් සඳහන් කළේය. නියත වශයෙන්ම එතුමාණන්ට හිමි වූ සංඥාව සහ ප්රාතිහාර්යය අල්ලාහ් එතුමාණන්ට හෙළි කළ අල් කුර්ආනයයි. මක්නිසාදයත් එහි පැහැදිලි හා අඛණ්ඩ ආශ්චර්යයන් අඩංගු වන බැවින් ද එහි ප්රතිලාභයේ බහුලත්වය සහ එහි ප්රතිලාභයේ පොදු බව පිහිටා ඇති බැවින් ද එහි ඇමතුම සාක්ෂි සහ සිදුවීමට යන දේ පිළිබඳ ප්රවෘත්ති අඩංගු වන බැවින් ද වේ. එමෙන්ම එහි ප්රතිලාභය සහභාගි වී සිටි අයට, සහභාගී නොවූ අයට, සොයාගත් අයට සහ සොයා ගන්නට අපේක්ෂා කරන අයට පොදුවේ ආවරණය වී ඇත. ඉන්පසු එතුමා මෙසේ පැවසීය: "මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ ඔවුන් අතුරින් බහුතරයක් දෙනා මා අනුගමනය කරන අය වීම ගැන මම අපේක්ෂා කරමි.”

http://www.sunnah.global/hadeeth/si/show/65231